# <u>තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව</u>

රාමක්‍රිෂ්ණ තේනාබඳු,
නායක පූජක මහා බෙත්මේ,
ශ්‍රී විෂ්ණු මහා දේවාලය,
දෙවිනුවර.

<u>**අභියාචක**</u>

**අභියාචනා අංකය : 97/2021** **-එදිරිව-**

බෞද්ධ කටයුතු පිලිබඳ දෙපාර්තමේන්තුව,
අංක 135, අනගාරික ධර්මපාල මාවත,
කොළඹ 07.

<u>**පොදු අධිකාරිය**</u>

**ඉදිරිපිටදී** :

1. විනිසුරු රෝහිණී වල්ගම (විශ්‍රාමික) - කොමසාරිස්
2. නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන - කොමසාරිස්
3. නීතිඥ ජගත් ලියන ආරච්චි - කොමසාරිස්

**පෙනී සිටීම** : අභියාචක දු:ක අංක 077-7719384 ඔස්සේ සම්බන්ධ වේ.
පොදු අධිකාරිය වෙනුවෙන් අතිරේක කොමසාරිස් ජනරාල් කීර්ති සිරිබද්ධන මහතා (තොරතුරු නිලධාරි) පෙනී සිටී.

**ලිඛිත සැළකිරීම්** : අභියාචක - ඉදිරිපත් කර නොමැත.
පොදු අධිකාරිය - 2020.09.30, 2021.03.24

**විභාග කළ දිනය** : 2021.06.28, 2022.03.22

**තීරණය කළ දිනය** : 2022.03.22

<u>**තීරණය :**</u>

**අභියාචනයට පසුබිම් වූ කරුණු**

අභියාචක විසින් 2020.05.04 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත සඳහන් තොරතුරු ඉල්ලා ඇත.

*"බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සතුව ඇති මහනුවර මහා විෂ්ණු දේවාලය පිළිබඳ පහත සඳහන් තොරතුරු සහ ලේඛනවල සත්‍යය/සහතික පිටපත් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි. 2000 වසරේ සිට 2015 වසර දක්වා මොහාන් පානබොක්කේ බස්නායක නිලමේගේ නිලකාලය.*

*1. මොහාන් පානබොක්කේ බස්නායක නිලමේ විසින් මහා විශ්ණු දේවාලයේ ඉඩම් බදුදීම/ඉඩම් මැනීම/පිඹුරුපත් සැකසීම සඳහා ජනතාවගෙන් මුදල් ලබාගෙන ඇත්නම් ඒ පිළිබඳ සත්‍ය තොරතුරු ලබා දෙන්න.*

*2. එලෙස මුදල් ලබාගෙන ඇත්නම් ඔබ දෙපාර්තමේන්තුව සතුව ඇති තොරතුරු අනුව මුදල් ප්‍රමාණය පිළිබඳ සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*3. බස්නායක නිලමේ විසින් මුදල් ලබාගෙන ඇති පුද්ගලයින්ගේ නම, ලිපිනය, ලබාගත් මුදල් ප්‍රමාණය පිළිබඳ ඔබ දෙපාර්තමේන්තුව සතුව ඇති ලේඛන සහ තොරතුරුවල සත්‍ය/සහතික පිටපත් ලබාදෙන්න.*

*4. උක්ත කරුණ පිළිබඳව මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විමර්ශන කටයුතු සිදුකරනු ලැබුවේ නම් ඒ පිළිබඳ තොරතුරු අදාළ වර්ෂය හා දිනය පිළිබඳ සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*5. මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් උක්ත කරුණු පිළිබඳ ප්‍රකාශ සටහන් කරගනු ලැබුවේ නම් ඒ පිළිබඳ තොරතුරු සහ අදාළ නිලධාරීන්ගේ නාම ලේඛනය සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*6. උක්ත කරුණ පිළිබඳ අල්ලස හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශන කටයුතු සිදුකරනු ලැබුවේ නම් ඒ පිළිබඳව සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*7. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ප්‍රකාශ සටහන් කරගනු ලැබුවේ නම් අදාළ නිලධාරීන්ගේ නාම ලේඛනය ලබාදෙන්න.*

*8. මොහාන් පානබොක්කේ බස්නායක නිලමේ ජනතාවගෙන් ලබාගත් මුදල් නැවත ජනතාව වෙත ලබාදීම සඳහා ඔබ දෙපාර්තමේන්තුව විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් සිදුකර ඇත්තේ නම් ඒ පිළිබඳ සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*9. මහනුවර මහා විෂ්ණු දේවාලයේ ඉහත සඳහන් බස්නායක නිලමේ වැඩ භාරගැනීමට ප්‍රථම තැන්පත් කරනු ලැබූ ඇප මුදල් ප්‍රමාණය පිළිබඳ සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*10. එම ඇප මුදල් ප්‍රමාණයෙන් ජනතාවගෙන් ලබාගත් ඉහත සඳහන් මුදල් ප්‍රමාණය පියවීමට හැකියාව ඇත්තේ නම් ඒ පිළිබඳ සත්‍ය තොරතුරු ලබාදෙන්න.*

*ඉල්ලා ඇති සියළු තොරතුරු අනුපිළිවෙලට ලබා දෙන මෙන්ද, සියලු තොරතුරු සහ ලේඛනයන් ඌනතාවයකින් තොරව සහ ප්‍රමාදයකින් තොරව සත්‍යය / සහතික පිටපත් මගින් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමි."*

මීට ප්‍රතිචාර ලෙස තොරතුරු නිලධාරි 2020.07.09 වන දිනැතිව සඳහන් කර සිටින ලද්දේ,

*"ඇමුණුමෙහි අංක 01, 02, 03, 04, 05, 06 හා 07 අදාල විමර්ශන සම්බන්ධව තොරතුරු මහනුවර බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තු ප්‍රාදේශීය කාර්යාලය සතුව නොමැති බව සඳහන් කරමි.*

*ඇමුණුමෙහි අංක 08 පිළිබඳව දේවාලය දැනුවත් කර ඇත. ඒ පිළිබඳ තොරතුරු මෙම කාර්යාලය සතුව නොමැත.*

*ඇමුණුමෙහි අංක 09ට අනුව ඇප මුදල රු. 50,000.00 කි."* යනුවෙනි.

මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින් 2020.07.20 දිනැතිව නම්කළ නිලධාරි වෙත අභියාචනයක් යොමු කර ඇත. නම්කළ නිලධාරි පනතේ සඳහන් නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක විසින් 2020.08.27 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉහත අංක දරණ අභියාචනය යොමු කර ඇත.

පොදු අධිකාරිය විසින් අභියාචකටද පිටපත් සහිතව 2020.09.30 වන දිනැති ලිපියක් මගින් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"……………… 02.එම ලිපියේ සඳහන් තොරතුරු පිළිබඳව ඉල්ලුම් කරු 2020-07-29 දිනැති ලිපි මගින් දැනුවත් කර ඇති බව දන්වමි.*

*03.පිළිතුරු ලබාදීමේ ලිපි පිටපතක් දැනගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කර සිටිමි."* යනුවෙනි.

එසේම, පොදු අධිකාරිය විසින් අභියාචකටද පිටපත් සහිතව 2021.03.24 වන දිනැති ලිපියක් මගින් වැඩිදුරටත් පහත සඳහන් කරුණු කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

*"....................... 03.ආර්. තේනාබදු මහතා විසින් 2020/05/04 දිනැතිව තොරතුරු දැනගැනීමේ පනත යටතේ කරුණු 10 ක් සඳහන් කරමින් ඒ පිළිබඳ තොරතුරු ඉල්ලා ඇත. එයට 2020.07.09 සහ 2020.07.29 දිනැති ලිපි මගින් පිළිතුරු ලබා දී ඇති"* බවයි.

**සළකා බැලීම**

පොදු අධිකාරිය වෙනුවෙන් සහභාගි වන තොරතුරු නිලධාරි කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර සිටින්නේ තොරතුරු ඉල්ලීමේ 01 සිට 08 දක්වා තොරතුරු තම පොදු අධිකාරියේ භාරයේ, පාලනයේ හෝ සන්තකයේ නොමැති බවය. බෞද්ධ විහාර දේවාල ගම් ආඥා පනතට අනුව මහනුවර විෂ්ණු දේවාලයේ බස්නායක නිලමේ පත් කිරීම, වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම, පනත යටතේ ඇතැම් අවස්ථාවන්වලදී බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ අවසරය ලබා ගැනීම වැනි නිශ්චිත කරුණු සම්බන්ධයෙන් පමණක් තම පොදු අධිකාරිය මැදිහත් වන බවත් ඒ අනුව ඉහත තොරතුරු ඉල්ලීමේ සඳහන් 01 සිට 08 දක්වා තොරතුරු තම පොදු අධිකාරියේ භාරයේ, පාලනයේ හෝ සන්තකය භාරයේ නොපවතින බවටත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. තොරතුරු අයිතම 09 සඳහා පිළිතුරු ලබා දී ඇති බවත් කියා සිටී.

තොරතුරු අයිතම 10 සම්බන්ධයෙන් පොදු අධිකාරිය ප්‍රකාශ කරන්නේ අදාළ දේවාලයේ දූෂණයක් සම්බන්ධ පැමිණිල්ලක් ලැබුණහොත් ඒ පිළිබඳව පරීක්ෂණයක් කිරීම සම්බන්ධව ඉහත පනතේ

විධිවිධාන ඇති නමුත් තොරතුරු අයිතම 10 සම්බන්ධව කිසිම තොරතුරක් තම පොදු අධිකාරිය සතුව නොමැති බවයි.

තොරතුරු නිලධාරිගේ මෙම කරුණු දැක්වීම පිළිගනිමින් අභියාචනාව ප්‍රතික්ෂේප කරයි.

මෙම නියෝගය අභියාචක වෙත, තොරතුරු නිළධාරි වෙත සහ පොදු අධිකාරිය වෙත දන්වා යැවීමට මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වරයා මෙහෙයවනු ලැබේ.

අභියාචනය ප්‍රතික්ෂේප කරන ලදී.